**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

වෙත යොමු කරන ලද

ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන්

**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

**යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

ගරු අජිත් **පී.** පෙරේරා මහතා, පා.ම. විසිනි

**2025** ජූනි මස **04** වැනි බදාදා

---

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு**

**ஆற்றுப்படுத்தப்பட்ட**

**தேசிய போக்குவரத்து ஆணைக்குழு (திருத்தச்) சட்டமூலம்**

**மீதான**

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**அறிக்கை**

**உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**தவிசாளர்**

**கௌரவ அஜித் பீ. பெரேரா, பா.உ. அவர்களால்**

**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**

**2025 யூன் 04, புதன்கிழமை.**

---

**Report of the**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**on**

**National Transport Commission (Amendment) Bill**

**referred to**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**Presented to Parliament by**

**Hon. Ajith P. Perera, M.P.**

**Chair of the**

**Sectoral Oversight Committee on Infrastructure and Strategic Development**

**Wednesday, 04 June 2025**

<u>කාරක සභාවේ වාර්තාව</u>

2025 මැයි මස 27 වන දින පාර්ලිමේන්තුවේදී රැස් වූ යටිතල පහසුකම් හා උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත**
  (2025 මැයි මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව යටිතල පහසුකම් හා උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**<u>සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:</u>**
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම. (සභාපති)
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
ගරු ධනුෂ්ක රංගනාත් මහතා, පා.ම.
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.
ගරු ජගත් විතාන මහතා, පා.ම.
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා, පා.ම.

**<u>කාරක සභාවේ ලේකම්</u>**
චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**
**<u>ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය</u>**
ආර්.එම්.එස්.බී. ජයසුන්දර මහතා, අතිරේක ලේකම් (පාලන)
එන්.ඩී.එන්.වී. ජයවර්ධන මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)
එම්.ඒ. ප්‍රියන්ති ගුණසේකර මහත්මිය, නීති නිලධාරී

**<u>ජාතික ගමනාගමන කොමිෂන් සභාව</u>**
ඉංජිනේරු පී.ඒ. චන්ද්‍රපාල මහතා, සභාපති
බී.එම්. ඉෆ්තිකාර් මහතා, අධ්‍යක්ෂ (තත්ත්ව සහතික)
කේ.ඒ.සී. කරුණාරත්න මහත්මිය, අධ්‍යක්ෂ (සැලසුම්)
එස්.ඩී. අතුකෝරල මහත්මිය, අධ්‍යක්ෂ (මෙහෙයුම්)
එච්.එම්.කේ. මධුවන්ති මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (නීති)
එම්.එන්. චන්ද්‍රරත්න මහතා, නීති නිලධාරී

**<u>නීතිපති දෙපාර්තමේන්තුව</u>**
නිර්මලන් විග්නේෂ්වරන් මහතා, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>**
එස්. එස්. එම්. ඩී. ආර්. වීරකෝන් මහත්මිය, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක
එච්.එස්.ඒ. ගුණසේකර මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**<u>හැඳින්වීම</u>**

මෙම පනතේ මූලික අරමුණ වන්නේ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට නව ප්‍රතිපාදන කිහිපයක් ඇතුළත් කිරීම සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව (NTC) දීර්ඝ කාලයක් තිස්සේ මුහුණ දුන් ප්‍රායෝගික ගැටලු කිහිපයකට විසඳුම් ලබා දීම සඳහා විධිවිධාන සැලසීමයි.

විශේෂයෙන්ම, මෙම සංශෝධනය මගින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මාර්ගස්ථ මගී ප්‍රවාහනය නියාමනය කිරීම සඳහා නව බලතල ඇතුළත් කර ඇත. මුල් පනත මගින් ආවරණය වූයේ මගී ප්‍රවාහනය පමණි. නව පනත් කෙටුම්පත මගින් පාසල් වෑන් රථ, ත්‍රීරෝද රථ සහ කාර්යාල ප්‍රවාහන ක්‍රම නියාමනය කිරීමටද බලතල ලැබේ. තවද, මෙම පනත් කෙටුම්පත මගින් අදාළ අමාත්‍යවරයාට වෙනත් ඕනෑම ප්‍රවාහන මාධ්‍යයක් නියාමනය කිරීමේ බලයද ඇතුළත් කර ඇත.

මෙම සංශෝධන පනත් කෙටුම්පත මගින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට බලය ලබා දී ඇති කර්තව්‍යයන් කිහිපයක්:-

- ජාතික මට්ටමෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන මාර්ගෝපදේශ සකස් කිරීම
- ප්‍රවාහන ගාස්තු ගණනය කිරීම සඳහා සූත්‍රයක් සකස් කිරීම හා වරින් වර සංශෝධනය කිරීම
- නවීන තාක්ෂණ පද්ධති භාවිතා කිරීම ප්‍රවර්ධනය හා නියාමනය කිරීම

- ප්‍රවාහන සේවා ආශ්‍රිත යටිතල පහසුකම් සඳහා පහසුකම් සැලසීම
- ප්‍රවාහන සේවා සඳහා ජාතික තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යෑම
- සේවා සපයන්නන් විසින් සලසනු ලබන සේවා අධීක්ෂණය කිරීම
- අවසර පත්‍ර ලාභීන් සඳහා විධාන නිකුත් කිරීම
- කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහය වීමට උප කමිටු පත් කිරීම

<u>කාරක සභා නිරීක්ෂණ</u>

1. පළාත් තුළ ප්‍රවාහනය මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (RPTA) විසින්ද, අන්තර් පළාත් බස් සහ අනෙකුත් ප්‍රවාහන මාධ්‍යයන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව (NTC) විසින්ද නියාමනය කරන බව.

2. විවිධ මගී සේවා සපයන්නන් (NTC, SLTB, පළාත් බස්) අතර ඇති වන ගැටුම් සහ ඒවා සමථයකට පත් කිරීමේදී NTC හි කාර්යභාරය පිළිබඳවත් එවැනි ගැටලු විසඳීම සඳහා දැනටමත් යාන්ත්‍රණයක් පවතින බව හා මෙම පනත මගින් NTC වෙත එම බලය ලබාදී ඇති බව.

3. ඒකාබද්ධ කාලසටහන් නොමැති වීම හේතුවෙන් රටේ සමස්ත මගී ප්‍රවාහනය ව්‍යාකූල තත්ත්වයක පවතින බව.

4. වාහන මෙහෙයවීම සඳහා අයදුම්කරුගේ අඛණ්ඩ මූල්‍ය ශක්‍යතාව ඇගයීම සඳහා අන්තර් පළාත් බස් බලපත්‍ර නිකුත් කිරීමේදී මෙහෙයුම්කරුට ව්‍යාපාරය මූල්‍යමය වශයෙන් පවත්වාගෙන යා හැකිද යන්න තක්සේරු කිරීම සිදු කරන බවත් ඒ සඳහා ආදායම් බදු වාර්තා සහ බැංකු ප්‍රකාශ වැනි ලේඛන පරීක්ෂා කරන බව.

5. රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා EPF/ETF ගෙවීම් සහ විනය වැඩි දියුණු කිරීමටත් EPF/ETF ගෙවීම් සහතික කිරීමටත් NTC/RPTA හරහා රියදුරන්/කොන්දොස්තරවරුන් තෝරා ගැනීම සහ පුහුණු කිරීම නියාමනය කළ යුතු බව.

6. 1991 අංක 37 දරන මුල් පනතේ 44 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාට රීති සෑදීමට බලය ලබාදී ඇති නමුත් මේ වන තෙක් කිසිදු රීතියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැති බව සහ නව පනතේ දඬුවම් සැලකිය යුතු ලෙස වැඩි කර ඇති බැවින් රීති සකස් කිරීමේ වගකීම වඩාත් තීරණාත්මක වන බව.

7. බලපත්‍ර නොමැතිව බස් ධාවනය කිරීමේ බරපතල වරද සඳහා අවමය රු. 250000/- සහ උපරිමය රු. 500000/- හෝ වසර පහක් දක්වා සිර දඬුවමක් පනවා ඇති බවත් අනෙකුත් වැරදි සඳහා දඬුවම් රීති මගින් නියම කරන බව. (කෙසේ වෙතත් සුළු වැරදි සඳහා ඉහත දඩ මුදල් සාධාරණ නොවන හෙයින් වැරදි වර්ගීකරණය කර ඒ අනුව දඬුවම් නියම කළ යුතු බව කාරක සභාවේ අදහස විය).

8. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පරීක්ෂකවරුන්ට NTC බලපත්‍රලාභී බස් පරීක්ෂා කිරීමට නොහැකි වීම සහ, මෙම පරීක්ෂණ සම්බන්ධීකරණය වී නොමැතිවීම නිසා NTC බස්රථ රීති කඩ කරන බවත් එබැවින් NTC සහ RPTA බස් දෙකටම අදාළ වන ඒකාබද්ධ පරීක්ෂණ කණ්ඩායමක් පත් කිරීම සුදුසු බව.

9. ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 2005 සංශෝධනයේ සිට ඒකාබද්ධ කාලසටහන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අධිවේගී මාර්ගවල සහ බදුල්ල-කොළඹ මාර්ගයේ උත්සාහයන් ගෙන ඇති බවත්, අන්තර් පළාත් මාර්ග සඳහා ඒකාබද්ධ කාලසටහන් පැවතුනද ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහ පසු විපරමක් නොමැතිකම නිසා අසාර්ථක වූ බවත්, GPS තාක්ෂණය උපයෝගී කර ගනිමින් ප්‍රධාන කොරිඩෝව කෙරෙහි අවධානය යොමු කරමින් නව උත්සාහයක් (පුත්තලම් කොරිඩෝවෙන් ආරම්භ කර) දැනට සිදුවෙමින් පවතින බව.

10. 2009 වසරේදී ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් මත පදනම් වූ 60:40 මාර්ග ධාවන කාලසටහන් අනුපාතය (SLTB සඳහා 40%, පෞද්ගලික බස් සඳහා 60%) SLTB හි ප්‍රමාණවත් බස් නොමැති වීම හේතුවෙන් ප්‍රායෝගික නොවන බව.

11. මගී සුවපහසුව සහ ආරක්ෂාව මෙම පනතේ ප්‍රධාන තේමාවක් බවත්, NTC වෙත මේ සම්බන්ධයෙන් බලය ලබාදී ඇති අතර මේ වන විට ආරක්ෂක ප්‍රමිති සකස් කරමින් පවතින බව.

<u>කාරක සභාවේ තීරණ</u>

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් 2025 ජූනි මස 04 වැනි බදාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.